2015 ජූනි 23 දිනැති මෙහි ඉංග්‍රීසි පිටපත මත මෙම පරිවර්තිත ව.ද.ප පාදක වේ.

# ව්‍යාපෘති දත්ත පත්‍රය

ව්‍යාපෘති සහ වැඩසටහන් සම්බන්ධ සාරාංශගත කරන ලද තොරතුරු ව්‍යාපෘති දත්ත පත්‍රවල අඩංගු වේ. ව්‍යාපෘති දත්ත පත්‍රිකාවක් යනු වැඩ කෙරෙමින් පවතින ව්‍යාපෘති සම්බන්ධ වාර්තාවක් බැවින් ඇතැම් තොරතුරු මෙහි පළමු පිටපත් වල ඇතුළත් නොවිය හැකි අතර එකී තොරතුරු ලැබෙන පරිදි ඇතුලත් කරනු ඇත. යෝජිත ව්‍යාපෘති සම්බන්ධ තොරතුරු තාවකාලික සහ හඟවන තොරතුරු වේ.

| | |
|---|---|
| **ව්‍යාපෘති දත්ත පත්‍රය සැකසූ දිනය** | – |
| **ව්‍යාපෘති දත්ත පත්‍රය යාවත්කාලීන කරන ලද්දේ** | 2015 අප්‍රේල් 27 |

| | |
|---|---|
| **ව්‍යාපෘති නාමය** | ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන-ණය අදියර 1 |
| **රට** | ශ්‍රී ලංකාව |
| **ව්‍යාපෘති/ වැඩසටහන් අංකය** | 47273-003 |
| **තත්වය** | අනුමැතිය ලැබී ඇත |
| **භූගෝලීය පිහිටීම** | – |

රාජ්‍ය වැඩසටහනක් හෝ ක්‍රමෝපාය සැකසීමේදී, ව්‍යාපෘතිය මූල්‍යනය කිරීමේදී හෝ මෙම වාර්තාවේ යම් භූගෝලීය සීමාවක් සටහන් කිරීමේදී ඕනෑම ප්‍රදේශයක් හෝ භූමි සීමාවක් සම්බන්ධ නෛතික හෝ වෙනයම් තත්වයන් සම්බන්ධයෙන් ආසියානු සංවර්ධන බැංකුව විසින් කිසිදු මත දැක්වීමක් සිදුකිරීමට අපේක්ෂා නොකරයි.

| | |
|---|---|
| **ක්ෂේත්‍රය සහ/ හෝ උපක්ෂේත්‍ර වර්ගීකරණය** | ප්‍රවාහන |
| **අනුක්ෂේත්‍රය** | මාර්ග ප්‍රවාහන (නාගරික නොවන) |
| **ක්‍රමෝපාය න්‍යාය පත්‍රය** | පාරිසරික වශයෙන් ධරණීය වර්ධනය (ESG)<br>සමස්ත ආර්ථික වර්ධනය (IEG) |
| **වෙනස්වීමේ තීරක** | ලිංග සමානතාවය සහ මුඛ්‍යධාරාව<br>පරිපාලන සහ හැකියා සංවර්ධනය (GCD)<br>පෞද්ගලික අංශය සංවර්ධනය (PSD) |
| **ස්ත්‍රී/පුරුෂ සමානතාවය සහ මුඛ්‍යධාරා වර්ගීකරණයන්** | වර්ගීකරණය 2: ඵලදායී ලිංග මුඛ්‍යධාරාව (EGM) |

## මූල්‍යකරණය

| සහායේ වර්ගය/ ප්‍රකාරතාව | අනුමත අංකය | අරමුදල් මූලාශ්‍රය | අනුමත වටිනාකම (දහස්) |
|---|---|---|---|
| ණය | 3171 | ආසියානු සංවර්ධන අරමුදල | 100,000 |
| – | – | ප්‍රතිරූප අරමුදල් | 18,000 |
| **මුළු එකතුව** | | | **ඇ.එ.ජ.ඩො 118,000** |

## ආරක්ෂණ වර්ගීකරණයන්

ආරක්ෂණ වර්ගීකරණ පිළිබඳව වැඩි විස්තර සඳහා කරුණාකර පහත යොමුවට පිවිසෙන්න
http://www.adb.org/site/safeguards/safeguard-categories

| | |
|---|---|
| **පරිසරය** | B |
| **ස්වේච්ඡා නොවන නැවත පදිංචි කිරීම** | B |
| **ආදිවාසී ජනතාව** | C |

## පාරිසරික සහ සාමාජයීය අංග පිළිබඳ සාරාංශය

**පාරිසරික අංගය**

දැනට පවතින ග්‍රාමීය සහ දේශීය මාර්ග අළුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම කෙරෙහි ණය වාරික 1 යොමු වේ. එබැවින් එය B බාණ්ඩය ලෙස දක්වා ඇත. 'සම්මත පාරිසරික කළමණාකරණ සැලසුම' සහ 'ඒකාබද්ධ ප්‍රාදේශීය මට්ටමේ ප්‍රථම පාරිසරික පරීක්ෂණ වාර්තාව' පිළියෙල කර ඇත. ඉදිරි ණය වාරික වලදී රජයේ පාරිසරික ආරක්ෂණ අවශ්‍යතා සහ ආසියානු සංවර්ධන බැංකුවේ ආරක්ෂණ ප්‍රතිපත්ති ප්‍රකාශය සමඟ අනුගතවීමට 'පාරිසරික ඇගයීම්' සහ 'සමාලෝචන රාමුව' සකසා ඇත.

**ස්වේච්ඡා නොවන නැවත පදිංචි කිරීම**

ආයෝජන වැඩසටහන සඳහා තෝරාගැනීමට සහ සූදානම් කිරීමට මාර්ගෝපදේශ කිරීම සඳහා 'නැවත පදිංචි කිරීමේ සැකිල්ල' සකසා ඇත. ව්‍යාපෘතියේ ණය අදියර 1 යටතේ ආවරණයවන මාර්ග මූල්‍යකරණය කරන අතර දැනට පවත්නා යෑමේ අයිතිය යටතේ සියළු මාර්ග වැඩිදියුණු කරනු ඇත. ස්වේච්ඡා නොවන නැවත පදිංචි කිරීම් බලපෑම් කිසිවක් හඳුනාගනු නොලැබීය.

**ආදිවාසී ජනතාව**

ණය වාරික 1 යටතේ ආදිවාසී ජනතාව සඳහා බලපෑමක් සිදු නොවනු ඇත. ආයෝජන වැඩසටහන සඳහා තෝරාගැනීමට සහ සූදානම් කිරීමට මාර්ගෝපදේශ සැපයීම සඳහා 'ආදිවාසී ජනතාවගේ සැලැසුම් සැකිල්ල' සකසා ඇත.

## පාර්ශවකරුවන් සමඟ සන්නිවේදනය, සහභාගිත්වය සහ උපදේශනය

**ව්‍යාපෘති සැලසුම්කරණ කාලය අතරතුර**

ව්‍යාපෘති මාර්ග ආශ්‍රිතව කුටුම්භ සමීක්ෂණ 4899, අර්ථවත් උපදේශණය සහ සමාජ සමීක්ෂණ (ආසන්න වශයෙන් ව්‍යාපෘති මාර්ග දෙපස කුටුම්භයන්ගෙන් 38%) සහ පොදු ස්ථානයන්හි තෝරා ගත් කණ්ඩායම් 14 සමඟ සාකච්ඡා පවත්වන ලදී. ව්‍යාපෘතිය පිළිබඳ දැනුවත්භාවය ඉහළ නැන්වීමට, මිනිසුන්ගේ අවශ්‍යතා සහ සලකාබැලීම් තීරණය කිරීමට, ප්‍රතිලාභ වැඩිදියුණු කිරීමට සහ ඍණාත්මක බලපෑම් අවම කිරීමට යෝජනාවන් ලබාගැනීම වෙනුවෙන් ප්‍රජා සහභාගිත්වය ලබාගන්නා ලදී. ව්‍යාපෘතිය සැකසීමේදී ප්‍රජා කණ්ඩායම් හඳුනාගෙන උපදේශණය සිදුකරන ලදී. ව්‍යාපෘතිය සකසන අතරතුර ග්‍රාමීය මාර්ග සම්බන්ධ විස්තරාත්මක නිර්මාණය අවසන් කිරීම සඳහා විස්තරාත්මක සාමාජයීය උපදේශණ මාර්ගෝපදේශ සකසා සහ නියමු ව්‍යාපෘති සිදු කර ඇත. මෙමගින් අසරණ සහ වැඩි වශයෙන් උපද්‍රව වලට ලක් විය හැකි පාර්ශවයන්ගේ සහභාගිත්වය අවධාරණය කරයි.

**ව්‍යාපෘතිය ක්‍රියාවට නැන්වීම අතරතුර**

ග්‍රාමීය මාර්ග අංගය සඳහා ක්‍රියාත්මක වන කාලය පුරාවට, මාර්ග නිර්මාණය කිරීමට 'ප්‍රජා සහභාගිත්ව ප්‍රවේශය' භාවිත කරමින් විශේෂයෙන්ම (i) මාර්ග ආරක්ෂාව වැඩිදියුණු කිරීමට (ii) පාරිසරික බලපෑම අවම කිරීමට සහ (iii) ඉදිකිරීම් බලපෑම් අවම කිරීමට නිරන්තර උපදේශණය සිදුකරනු ඇත. සියළුම ව්‍යාපෘති ප්‍රදේශයන්හි දුක්ගැනිවිලි සඳහා සහන සැලසීමේ යාන්ත්‍රණයක් පිහිටුවනු ඇත. විවිධ ස්ථාන හරහා ව්‍යාපෘති තොරතුරු මහජනතාවට නිරාවරණය කරනු ඇත. සිවිල් සමාජ සඳහා ව්‍යාපෘති තොරතුරු පහසුවෙන් ලබාගත හැකි පරිදි පවත්වාගෙනයනු ඇත. ව්‍යාපෘති මාර්ග ආශ්‍රිතව පවතින සිවිල් සමාජ සංවිධාන ප්‍රජා සහභාගිත්වයේ අංගයක් ලෙස මාර්ග නිර්මාණය අවසන් කිරීමට සම්බන්ධ වන අතර දුක්ගැනිවිලි සමනය කිරීමේ යාන්ත්‍රණයේ කොටසක්ද වනු ඇත. ඉදිකිරීම් බලපෑම, සමාජ සහ පාරිසරික බලපෑම සහ මාර්ග ආරක්ෂාව ඇතුළත්ව ග්‍රාමීය ප්‍රවේශ මාර්ග සම්බන්ධ අවසන් නිර්මාණය සැකසීමේදී දේශීය ප්‍රජාව (අවම වශයෙන් 40% ක් කාන්තාවන් සහිතව) උපදේශණය කරනු ඇත.

## විස්තරය

කලින් කල සිදුවන මූල්‍යකරණ ඉල්ලීම යටතේ මූල්‍යකරණය සඳහා යෝජිත මෙම ව්‍යාපෘතිය ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන යටතේ දකුණු පලාත තුළ අංග තුනකින් යුතු ව්‍යාපෘතියක් වන ව්‍යාපෘති 1 හි කොටසකි. (i) දකුණු පලාතේ මාර්ග දියුණු කිරීම: මෙම අංගය ග්‍රාමීය ප්‍රවේශ මාර්ග කි.මී 560 සහ දේශීය මාර්ග කි.මී 130 ක් දියුණු කිරීම සහ / හෝ නඩත්තු කරනු ඇත. කි.මී 510 ක දේශීය මාර්ග සහ කි.මී 130 ජාතික මාර්ග වලින් සමන්විත මෙම ග්‍රාමීය ප්‍රවේශ මාර්ග ග්‍රාමීය මධ්‍යස්ථාන සහ ප්‍රධාන මාර්ග පද්ධතිය අතර ප්‍රවේශ මාර්ගයන් වනු ඇත. ග්‍රාමීය ප්‍රවේශ මාර්ග සියළුම කාලගුණ ප්‍රමිතීන්ට අනුව සංවර්ධනය කරන අතර වසර තුනක් නඩත්තු කරනු ඇත. ග්‍රාමීය ප්‍රවේශ මාර්ග ආසන්නයේ පිහිටි සමාජ ආර්ථික මධ්‍යස්ථාන ජාතික මාර්ග හරහා සම්බන්ධ කරනු ඇත. මාර්ග කළමනාකරණ ගිවිසුම් යටතේ කි.මී 110 ක් පමණ වන ජාතික මාර්ග කොරිඩෝවන් වසර හතක් පුරාවට වැඩිදියුණුකර, නඩත්තු කරනු ඇත. එසේම තවත් කි.මී 20 ක් පමණ වන ජාතික මාර්ග අංශ ග්‍රාමීය ප්‍රවේශ මාර්ග සමඟ වසර තුනක් පුරාවට වැඩිදියුණුකර, නඩත්තු කරනු ඇත. (ii) ධාරිතා වර්ධනය: මෙම අංගය යටතේ මාර්ග වත්කම් කළමනාකරණ මාර්ග නියෝජිත ආයතන, ව්‍යාපෘති කළමනාකරණය සහ ගිවිසුම් පරිපාලනය යන අංශ සම්බන්ධයෙන් ධාරිතා වර්ධනය කරනු ඇත. මහා මාර්ග, වරාය හා නාවික අමාත්‍යංශය, මාර්ග සංවර්ධන අධිකාරිය සහ පලාත් සහ දේශීය මාර්ග නියෝජිත ආයතන මේ යටතේ අදාල වේ. මධ්‍යම, පලාත් සහ දේශීය මට්ටමින් එකමුතුව මාර්ග වත්කම් කළමනාකරණ ප්‍රවේශයක් ගොඩනැගීමට මාර්ග සංවර්ධන අධිකාරිය පෙරමුණ ගනු ඇත. මහා මාර්ග, වරාය හා නාවික අමාත්‍යංශය සහ මාර්ග සංවර්ධන අධිකාරියට එහි ධාරිතා සංවර්ධනයට සහ මාර්ග සංවර්ධන අධිකාරියෙන් දකුණු පලාත තුළ පලාත් සහ දේශීය මාර්ග නියෝජිත ආයතන වෙත කුසලතා පැවරීමේ වැඩසටහන් සඳහා පෞද්ගලික උපදේශණ සේවා යොදවනු ඇත. (iii) ව්‍යාපෘති සැකසීම: මෙම අංගය යටතේ පසුව යෙදෙන ණය වාරික සඳහා ශක්‍යතා අධ්‍යයන සහ ඉන්ජිනේරු නිර්මාණ ක්‍රියාවේ යොදවනු ඇත. මෙහි විෂය පථය යටතට සබරගමුව පලාත, දකුණු පලාතේ කලුතර දිස්ත්‍රික්කය, මධ්‍යම පලාත, උතුරු මැද පලාත සහ වයඹ පලාත ආවරණය වේ.

## ව්‍යාපෘති සාධාරණීකරණය සහ දේශීය/ කාලාපීය ක්‍රමෝපාය කෙරෙහි ඇති සම්බන්ධය

ආසියාව සහ යුරෝපය අතරතුර ප්‍රධාන මුහුදු වෙළෙඳ මාර්ගය ආසන්නයේ උපායමාර්ගික ස්ථානයක ශ්‍රී ලංකාවේ පිහිටීම අන්තර්ජාතික වරාය නගරයක් ලෙස මෙන්ම ඉන්දියානු උප මහද්වීපය තුළ නැව්භාණ්ඩ නැවෙන් නැවට මාරු කිරීමේ මධ්‍යෂ්ථානයක් ලෙස සංවර්ධනය වීමට කොළඹ නගරයට අවස්ථාව සලසයි. මෙම දූපත් රාජ්‍යය බොහෝදුරට සමතලා හෝ රැළි සහිත මුහුදුබඩ තැනිතලා සහ රට මධ්‍යයේ පිහිටි කඳු වලින් සමන්විතය. ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් 85% ක් පමණ (2012 දී මිලියන 20.3) ග්‍රාමීය සහ අර්ධ නාගරික ප්‍රදේශ වල වාසය කරයි. 2009 මැයි මාසයේදී සිවිල් ගැටුම් අවසන් වීමෙන් පසුව ශ්‍රී ලංකාව ශක්තිමත් ආර්ථික වර්ධනයක් අත්පත් කර ගෙන ඇත. ආර්ථික වර්ධන වේගය 2010 සහ 2011 වසර වලදී 8% ක්වූ අතර දුර්වල විදේශීය ඉල්ලුම , නියඟය සහ ගංවතුර හේතුවෙන් එහි අගය 2012 වසරේදී 6.4% දක්වා පහත වැටුනත් 2013 වසරේදී 7.3% ලෙස යථා තත්වයට පත් විය. බාහිර පරිසරය වැඩිදියුණු වීම, ඉහළ මට්ටමේ ආයෝජන සහ දේශීය පරිභෝජනය යථා තත්වයට පත්වීම 2014 සහ 2015 වසර වලදී වේගවත් ආර්ථික වර්ධන වේගයක් පවත්වාගෙන යනු ඇත. දළ දේශීය නිෂ්පාදනයෙන් 89% ක් ආවරණය වන කාර්මික සහ සේවා අංශ ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය මෙහෙයවූ අතර කෘෂිකාර්මික අංශය 11% ක දායකත්වයක් දක්වා ඇත. ශක්තිමත් ආර්ථික වර්ධනයේ ප්‍රථිඵලයක් ලෙස 2006 වසරේදී 15% ක් ඉක්මවා පැවති ජාතික දරිද්‍රතා කුටුම්භ ප්‍රතිශතය 2010 වසරේදී 9% වඩා පහත වැටුණි. එතකුදු වූවත්, අඩු සංවර්ධන ප්‍රදේශ ඉහළ නම්‍යතාවයකින් දිළිදුබවේ අඩුවීම කෙරෙහි සංවේදී වී නොමැත (ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදනයේ ඒකකයක වර්ධනයට දිළිදුබව දක්වන සමානුපාතික වෙනස්වීම). ආර්ථික කටයුතු ව්‍යාප්ත වීමට සහ මූලික සමාජ සම්පත් වලට පවතින ප්‍රවේශයට විශේෂයෙන්ම පලාත් සහ දේශීය අධිකාරිත්ව යටතේ පවතින දුර්වල මට්ටමේ ප්‍රවාහන යටිතල පහසුකම් බාධා පමුණුවා ඇත.

## සංවර්ධනයේ බලපෑම

ග්‍රාමීය ප්‍රජාව සහ සමාජ ආර්ථික මධ්‍යස්ථාන අතර සම්බන්ධතාවය වැඩිදියුණු කිරීම

## ව්‍යාපෘති ප්‍රතිඵල

| ප්‍රතිඵල පිළිබඳ විස්තරය | ප්‍රතිඵල දෙසටවූ ප්‍රගතිය |
|---|---|
| ව්‍යාපෘති ආවරණ මාර්ග තුළ වැඩිදියුණුවූ ප්‍රවාහන කාර්යක්ෂමතාවය | **ඇගයීමට කල්වේලා වැඩිය.** |

## ප්‍රතිඵල සහ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය

| ව්‍යාපෘති ප්‍රතිඵල පිළිබඳ විස්තරය | ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පිළිබඳ තත්වයන් (ප්‍රතිඵල, ක්‍රියාකාරකම් සහ කරුණු) |
|---|---|
| 1. දකුණු පළාත තුළ තෝරාගත් ප්‍රජාවන් සහ සමාජ ආර්ථික මධ්‍යස්ථාන අතරතුර වැඩිදියුණුවූ මාර්ග තත්වයන්<br>2. මාර්ග නියෝජිත ආයතන වල වැඩිදියුණුවූ හැකියාව<br>3. සම්පූර්ණකල පසුව යෙදෙන ව්‍යාපෘති සඳහා ව්‍යාපෘති සැකසීම | 2015 මාර්තු මස 16-20 අතරතුර ආරම්භක මෙහෙයුම පවත්වන ලදී. 2015 මාර්තු 30 වන විට ජයග්‍රාහී කොන්තරාත්කරුවන්ට ග්‍රාමීය ප්‍රවේශ මාර්ග වැඩිදියුණු කිරීමට සාම්ප්‍රාදායික මාර්ග කොන්තරාත්තු 9 ක් සඳහා ප්‍රතිග්‍රාහක ලිපිය නිකුත් කරන ලදී. ජාතික මාර්ග අළුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම සඳහා මාර්ග කළමනාකරණ ගිවිසුම් ප්‍රසම්පාදන ආරම්භවන අතර ග්‍රාමීය ප්‍රවේශ මාර්ග සඳහා කොන්තරාත්තු පිරිනමයි. 2015 අප්‍රේල් 23 දින මහජන තොරතුරු මධ්‍යස්ථානය 01 සඳහා වන ඉදිරිපත් කිරීම් 4 භාරදුන් අතර 2015 අප්‍රේල් 24 වැනි දින ආසියානු සංවර්ධන බැංකුව විසින් එහි පැහැදිලිකිරීම් සඳහා ඉල්ලීම යොමු කරන ලදී. |
| **සංවර්ධන අරමුණු පිළිබඳ තත්වයන්** | **මෙහෙයුම්/ ඉදිකිරීම් පිළිබඳ තත්වයන්** |
| – | – |
| **වැදගත් වෙනස්කම්** | |
| – | |

## ව්‍යාපාරික අවස්ථාවන්

**පළමු ලැයිස්තුගත කළ දිනය** 2014 අගෝස්තු 14

**උපදේශණ සේවාවන්**

ව්‍යාපෘති කළමනාකරණය, ගිවිසුම් පරිපාලනය සහ ධාරිතා සංවර්ධන වැඩසටහන් සම්බන්ධයෙන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකක සඳහා සහය වීමට උපදේශණ ආයතන සහ පෞද්ගලික උපදේශකයන් තෝරාගනු ඇත. ග්‍රාමීය මාර්ග සංවර්ධනය, ජාතික මාර්ග අළුත්වැඩියාව සහ මාර්ග පද්ධතිය නඩත්තු කිරීම සහ මෙහෙයුම් කටයුතු සමඟ සම්බන්ධ අය අතුරින් සිවිල් කටයුතු සඳහා කොන්තරාත්කරුවන් තෝරාගනු ඇත. උපදේශකයන් භාවිත කිරීම සම්බන්ධ ආසියානු සංවර්ධන බැංකුවේ මාර්ගෝපදේශය අනුව (2013, කලින් කලට සිදුකල සංශෝධනයන් අනුව) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට සහ හැකියා සංවර්ධනයට සහය වීම සඳහා උපදේශකයන් ලෙස ආයතන සහ පුද්ගලයන් බඳවා ගනු ඇත.

**ප්‍රසම්පාදනය**

ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීම කඩිනම් කිරීම සඳහා සිවිල් කටයුතු සහ උපදේශණ සේවා ප්‍රසම්පාදනය කිරීමට කල්තියා ගිවිසුම්ගත කිරීම්, පූර්ව ගිවිසුම් මූල්‍යකරණ ක්‍රම භාවිතා කරනු ඇත. සිවිල් කටයුතු සහ උපකරණ ප්‍රසම්පාදනය ආසියානු සංවර්ධන බැංකුවේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශය අනුව (2013, කලින් කලට සිදුකල සංශෝධනයන් අනුව) සිදුකරනු ඇත. වැඩ කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීමේදී 'ප්‍රතිඵල සහ කාර්යයඵල-පාදක මාර්ග ගිවිසුම් ආකාරය' භාවිත කරමින් අන්තර්ජාතික හෝ ජාතික තරඟකාරී ලංසු තැබීමේ පටිපාටි අනුගත කරනු ඇත. ආසියානු සංවර්ධන බැංකුවේ අවශ්‍යතාවයන්ට අනුව අනුගත වන පරිදි සංශෝධනය කරමින් ලෝක බැංකුව විසින් සැකසූ ලංසු තැබීමේ සහ කොන්ත්‍රාත්තු ලියකියවිලි භාවිතා කරනු ඇත.

**ප්‍රසම්පාදන සහ උපදේශණ නිවේදන**

http://www.adb.org/projects/47273-003/business-opportunities

## කාලසටහන

| | |
|---|---|
| **සංකල්ප අනුමත කිරීම** | – |
| **තොරතුරු සෙවීම** | – |
| **කළමණාකරණ සමලෝචන රැස්වීම** | 2014 ජූනි 13 |
| **අනුමැතිය** | 2014 ඔක්තෝබර් 3 |

## ඉතා වැදගත් අවස්ථාවන් / සන්ධිස්ථාන

| අනුමැති අංකය | අනුමැතිය | අත්සන් කිරීම | කාර්යයසාධනය | නිම කිරීම | | |
|---|---|---|---|---|---|---|
| | | | | ප්‍රථම | සංශෝධනය | සැබෑ |
| ණය 3171 | 2014 ඔක්තෝබර් 3 | 2014 නොවැම්බර් 5 | 2015 ජනවාරි 7 | 2021 සැප්තැම්බර් 30 | – | – |

## උපයෝගීකරණය

| දිනය | අනුමැති අංකය | ආ.ස.බැ (ඇ.එ.ජ ඩොලර් දහස්) | වෙනත් (ඇ.එ.ජ ඩොලර් දහස්) | ශුද්ධ අනුපාතය |
|---|---|---|---|---|
| **සමුච්චිත ගිවිසුම් පිරිනැමීම්** | | | | |
| 2015 ජූනි 22 | ණය 3171 | 67,423 | 0 | 74.00% |
| **සමුච්චිත වියපැහැදිම් ගෙවීම** | | | | |
| 2015 ජූනි 22 | ණය 3171 | 2,600 | 0 | 3.00% |

## සම්මුති තත්වයන්

පහත සඳහන් වර්ගීකරණයන්ට අනුව සම්මුතීන් කාණ්ඩගත කරනු ඇත- විගණනය කල ගිණුම්, ආරක්ෂණ, සමාජ, අංශය, මූල්‍ය, ආර්ථික සහ වෙනත්. පහත සඳහන් නිර්ණායක යොදා ගනිමින් සම්මුති කෙරෙහි අනුගතවීම ශ්‍රේණිගත කරයි: (i) තෘප්තිමත්- උපරිම වශයෙන් එක් ව්‍යතිරේකයකට අවසර ඇතිව අදාල කාණ්ඩයේ සියළුම සම්මුති සමඟ අනුගතව ඇත, (ii) කොටසක් තෘප්තිමත්- අදාල කාණ්ඩය තුළ උපරිම වශයෙන් සම්මුති දෙකක් සමඟ අනුගතව නැත, (iii) අතෘප්තිමත්- අදාල කාණ්ඩය තුළ තුනක් හෝ ඊට වැඩි සම්මුති සංඛ්‍යාවක් සමඟ අනුගතව නැත. 2011 මහජන ගමනාගමන ප්‍රතිපත්තියට අනුව 2012 අප්‍රේල් මස 2 වැනි දිනයෙන් පසුව සිදුකල 'ගිවිස ගැනීම් සඳහා ඇරයුම්' අදාලවන ව්‍යාපෘති සඳහා පමණක් ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශන සඳහා අනුගතවීම් ශ්‍රේණිගත කිරීම් අදාල වනු ඇත.

| අනුමැති අංකය | කාණ්ඩය | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | අංශය | සමාජ | මූල්‍ය | ආර්ථික | වෙනත් | ආරක්ෂණ | ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශන |
| ණය 3171 | තෘප්තිමත් | තෘප්තිමත් | තෘප්තිමත් | – | තෘප්තිමත් | තෘප්තිමත් | – |

## සම්බන්ධවීමේ සහ යාවත්කාලීන කිරීමේ විස්තර

| | |
|---|---|
| **ආ.ස.බැ වගකිව යුතු නිළධාරී** | ලී මින්ග් ටයි (tlming@adb.org) |
| **ආ.ස.බැ වගකිව යුතු දෙපාර්තමේන්තුව** | දකුණු ආසියා දෙපාර්තමේන්තුව |
| **ආ.ස.බැ වගකිව යුතු අංශය** | ප්‍රවාහන සහ ගමනාගමන අංශය, දකුණු ආසියා දෙපාර්තමේන්තුව |
| **ක්‍රියාවට නැංවීමේ නියෝජිත ආයතන** | – |

## යොමු

| | |
|---|---|
| **ව්‍යාපෘති වෙබ් පිටුව** | http://www.adb.org/projects/47273-003/main |
| **ව්‍යාපෘති ලිපි ලේඛණ ලැයිස්තුව** | http://www.adb.org/projects/47273-003/documents |